කින්නියා නගර සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 13 දින ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභා ලේකම්වරයා වෙත යවා තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කින්නියා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගණකාධිකරණ අඩුපාඩු
--------------------------

(අ) පුරනැඟුම වැඩසටහන යටතේ රු.6, 161,693 ක පිරිවැයකට සංචාරක බංගලාවක් ඉදිකර 2015 වර්ෂයේදී සභාවට භාරදී තිබුණි. මෙය නොනිමි වැඩ යටතේ පෙන්නුම් කර තිබූ බැවින් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයට අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ලෙජරය අනුව 2016 දෙසැම්බර් 31 දිනට ණය හිමි ශේෂය රු. 300,015 ක් විය. මෙම ශේෂය, ශේෂ පත්‍රයේ එදිනට රු.3,016,376 ක හර ශේෂයක් ලෙස පෙන්වා තිබුණි. ඒ හේතුවෙන් ණය හිමියන් රු.3,316,091 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සංචාරක බංගලාව සඳහා රු.1,707,967 ක් වටිනා ගෘහ භාණ්ඩ සභාව විසින් මිලදී ගෙන තිබුණි. මෙය ජංගම නොවන වත්කම් යටතේ රු.1,575,992 ක් වශයෙන් දැක්වීම හේතු කොට ගෙන රු.131,975 ක් අඩුවෙන් දැක්වුණි.

(ඈ) කඩ කාමර කුලී ලේඛනයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා අයකර ගත් කඩ කාමර කුලීය රු.9,529,633 ක් විය. එනමුත් මෙය රු.5,919,219 ක් ලෙස ආදායම් හා වියදම් ගිණුමේ දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් කඩ කාමර කුලීය රු. 3,610,414 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ලෙජරයට අනුව ටෙන්ඩර් තැන්පතු රු.4,240,695 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.3,554,099 ක් ලෙස පෙන්නුම් කෙරිණි. එහි ප්‍රතිඵලයක් ලෙස ටෙන්ඩර් තැන්පතු රු. 686,596 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) පෙරිය කින්නියා ආදාහනාගාරයේ විදුලිය සම්බන්ධතාවය සවිකිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලයට රු. 477,856 ක මුදලක් ගෙවා තිබුණි. පළාත් සභාවෙන් ලැබිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල මෙය පිළිබිඹු නොවිණි. ඒ අනුව ලැබිය යුතු මුදල් ඊට සමාන මුදලකින් අඩුවෙන් දැක්විණි.

(උ) රු.2,263,918 ව්ටිනාකමැති ඉඩම්, ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, ප්‍රාග්ධන යෙදුමට දායකවීමේ ගිණුමට ඇතුළත් කර නොතිබූ බැවින් ඊට සමාන ප්‍රමාණයකින් එම ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ශේෂ පත්‍රයේ දැක්වූ වත්කම් හා බැරකම් පිළිවෙලින් රු.137,050,753 ක් හා රු.110,708,613 ක් වුයෙන්, එහි ප්‍රතිඵලයක් ලෙස බැරකම් රු. 26,342,140 කින් අඩුවෙන් දැක්විණි.

1.3.2 නීති රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

---

නගර සභා ආඥා පනතේ 255 පරිච්ඡේදයේ විධිවිධාන අනුව මහජනයාගේ දැනගැනීම සඳහා මූල්‍ය ප්‍රතිඵල සාරාංශයක් රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු වේ. 2017 අගෝස්තු 02 දින දක්වාම සභාව විසින් එවැනි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

---

2.1 මූල්‍ය ප්‍රතිඵලය

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,331,526 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.925,243 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

---

2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

---

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම සහ සමාලෝචිත වර්ෂය අවසානයේ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තු ගත ආදායම | තත්‍ය ආදායම | 2016.12.31 දිනට හිඟ ආදායම් එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,500 | 1,455 | 1,273 |
| බදු කුලීය | 8,471 | 6,569 | 245 |
| සේවා ගාස්තු | 2,111 | 2,508 | - |
| ආදායම් රැස්කිරීම | 3,720 | 3,273 | 448 |

2.2.2. ආදායම් පරිපාලනය

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ගවමස් කඩ බදු කුලී හිඟ මුදල් වශයෙන් වූ රු. 3,192,518 ක් සහ මාළු කඩ බදු කුලී හිඟ මුදල් වශයෙන් වූ රු. 6,103,123 ක එකතුව රු.9,295,640 ක් අවුරුදු 8 ක් පුරා හිඟ හිට තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සති අන්ත පොළ බදු සහ කුකුල් මස් කඩ බදු කුලී වශයෙන් පිළිවෙලින් ලැබිය යුතු රු.245,722 ක් හා රු.17,666 ක් අවුරුදු 06 ක් පුරා අය නොවී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 වරිපනම් හා බදු

---

නගර සභා ආඥා පනත (අධිකාරය 255) 160 වන වගන්තියට අනුව නගර සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම්, ගොඩනැගිලි හා ඉදිකරන ලද නිවාස වලින් 2006 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබිය යුතු එකතුව රු. 1,273,221 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) ආයතන කිහිපයකින් පරිත්‍යාග වශයෙන් ලද වාහන 06 ක් නගර සභාව විසින් වසර 11 ක් තිස්සේ භාවිතා කර තිබුණි. සභාව නමින් වාහනවල අයිතිය සභාව නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් නියම කර ඇති පරිදි, සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා සභාව විසින් යන්ත්‍රයක් සවිකර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩලය විසින් අයිතම 97 ක් වෙන්දෙසි කිරීමට නිර්දේශ කර තිබුණි. ඒ නමුත් මේ දක්වා මෙය සිදුකර නොතිබුණි.

(ඇ) පළාත් මූල්‍ය රීති 432(2) සහ 432(3) මඟින් නියම කර ඇති පරිදි 2016 මාර්තු 15 සිට 2017 අප්‍රේල් 06 දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් JCB යන්ත්‍රයේ ධාවන සටහන්, ඊට වගකිව යුතු නිලධාරියා විසින් නඩත්තු කර නොතිබුණි.

3.2 අනාර්ථික ගනුදෙනු

--------------------

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 2/2011 චක්‍රලේඛයේ 4.1 වගන්තිය පරිදි අනියම් හා තාවකාලි සේවකයන් සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වේ. ඒ නමුත් චක්‍රලේඛ උපදෙස් උල්ලංඝනය කරමින්, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවා තිබුණි. සේවා නියුක්තියන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම 2012 ජනවාරි සිට 2015 අප්‍රේල් දක්වා ප්‍රමාද කර තිබු අතර, සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම 2014 මාර්තු සිට 2015 පෙබරවාරි දක්වා ප්‍රමාද කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.482,710 ක මුදලක් අධිභාර වශයෙන් මෙම අරමුදල්වලට ගෙවා තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

ලේකම් සහ ගණකාධිකාරී තනතුරුවල පුරප්පාඩු පිරිවීම සඳහා පසුගිය වසර 06 පුරාම සභාව විසින් කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සඳහා විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i. ලෙජර් විධිමත්ව යාවත්කාලීනව පවත්වා ගැනීම<br>ii. වත්කම් වර්ගීකරණය |
| (ආ) | ස්ථාවර වත්කම් | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීම |
| (ඇ) | ආදායම් රැස්කිරීම | හිඟ ආදායම් රැස්කිරීම සඳහා කටයුතු කිරීම |